(Thesis)
C
372

# සමාජ පන්තිය
# සහ
# අධ්‍යාපන ප්‍රගතිය අතර බැඳීම

(අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ආශ්‍රිත අධ්‍යයනයක්)

පී.ආර්.පී.සිරිවර්ධන

බී.ඒ. (ලංකා), අධ්‍යාපන ඩිප්ලෝමා - සම්මාන (ලංකා)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය
සම්බන්ධ අවශ්‍යතා අර්ථ වශයෙන්
පූරණය කිරීම පිණිස ඉදිරිපත් කරන
පර්යේෂණාත්මක නිබන්ධනය.

පර්යේෂණ උපදේශක: ආචාර්ය මො.උපාලි සේදර

366135

1982 ඔක්තෝම්බර්

## සාරාංශය

දෙමව්පිය සමාජ පන්තිය, දෙමව්පිය අධ්‍යාපනික මට්ටම, අධ්‍යාපන ක්‍රමය පිළිබඳ දෙමව්පිය දැනීම සහ තම දරුවන් කෙරෙහි දෙමව්පියන් තබන අභිලාෂ කොතෙක් දුරට ශිෂ්‍යයාගේ ශාස්ත්‍රීය සාධනය, ශිෂ්‍ය පාසැල් විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීම හා ශිෂ්‍ය රැකියා අපේක්ෂණ ඇති කර ගැනීම කෙරෙහි බලපාන්නේ දැයි සොයා බලනු වස් සකස් කෙරුණු මෙම අධ්‍යයනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ස්වායත්ත සාධක මැනවින් නියෝජනය වන සේ පවුල් ඒකක 165 ක් අධ්‍යයනයට ලක් කෙරිණ. සමාජ පන්තිය දෙමව්පිය අධ්‍යාපනය ප්‍රමාණනය කිරීමේ ප්‍රශ්නාවලියක් ද, අධ්‍යාපන ක්‍රමය පිළිබඳ දෙමව්-පිය දැනීම ප්‍රමාණනය කිරීමේ ප්‍රශ්නාවලියක් ද, සිය දරුවන් කෙරෙහි පවත්නා අභිලාෂ ප්‍රමාණනය කෙරෙන ප්‍රශ්නාවලියක් ද, එම පවුල් ඒකකවල 1980

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි දරුවන්ගේ ශාස්ත්‍රීය සාධනය, විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීම හා අනාගත රැකියා අපේක්ෂණ හඳුනා ගැනීමේ ප්‍රශ්නාවලියක් ද ප්‍රමුඛ පර්යේෂකයා විසින් මෙහෙයවන ලද සම්මුඛ සාකච්ඡාවන් සහ නිරීක්ෂණයන් තුළින් ගොනු කර ගන්නා ලද දත්ත කයි වර්ග පරීක්ෂාව මගින් විමර්ශනයට ලක් කරන ලදුව පහත දැක්වෙන නිගමනයන් හඳුනා ගැනිණ.

1. දෙමව්පිය සමාජ පන්තිය ගැහැණු ළමුන්ගේ මෙන් ම පිරිමි ළමුන්ගේ ද අධ්‍යාපනික සාධනය කෙරෙහි වෙසෙසි බලපෑම් කරයි. සමාජ පන්තිය සහ ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය අතර ඉතා සමීප සහසම්බන්ධතාවක් පවතී.

2. පවුලේ ජනගහන සංඛ්‍යාව සහ ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය අතර වෙසෙසි සබඳතාවක් ඇත. ශිෂ්‍ය රැකියා අපේක්ෂණ සහ පාසැලේ විෂය බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි පවුලේ ජනගහන සංඛ්‍යාව සම්බන්ධතාවක් නොදක්වයි.

3. පවුලේ අනුපිළිවෙළ අංකය සහ ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය අතර සම්බන්ධතාවක් නැත.

4. දෙමව්පිය අධ්‍යාපන මට්ටම ඉහළින් පවතින විට දරුවාගේ ශාස්ත්‍රීය සාධනය ද ඉහළ තලයක පවතී.

5. අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ දෙමව්පිය දැනීම ඉහළින් පවත්නා විට, දරුවාගේ ශාස්ත්‍රීය සාධනය ද ඉහළ මට්ටමක පවතී.

6. දෙමව්පියන් තම දරුවන්ගේ රැකියාවන් පිළිබඳ ව පවත්නා අභිලාෂ සහ දරුවාගේ ශාස්ත්‍රීය සාධනය අතර සමීප සම්බන්ධතා තිබේ. අභිලාෂ ඉහළ නම් සාධනය ද ඉහළින් පවතී.

7. ශිෂ්‍යයා සහභාගී වන පාසැල් විෂය බාහිර ක්‍රියාකාරකම් සහ දෙමව්පියන්ගේ සමාජ පන්තිය අතර සමීප සම්බන්ධතා තිබේ.

8. ශිෂ්‍යයා සහභාගී වන විෂය බාහිර ක්‍රියාකාරකම් සහ දෙමව්පියන්ගේ අධ්‍යාපනය අතර සම්බන්ධතාවක් නැත.

9. අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ දෙමව්පිය දැනීම සහ ශිෂ්‍ය විෂය බාහිර ක්‍රියාකාරකම් අතර ද සම්බන්ධතාවක් නැත.

10. දෙමව්පිය අභිලාෂ සහ ශිෂ්‍ය විෂය බාහිර ක්‍රියාකාරකම් අතර වෙසෙසි සබඳතාවක් පවතී. එසේ වුවත් ගැහැණු ළමුන් සම්බන්ධ ව එවැන්නක් නැත.

11. දෙමව්පිය සමාජ පන්තිය සහ ශිෂ්‍ය රැකියා අපේක්ෂණ අතර වෙසෙසි වූ සහසම්බන්ධතාවක් ඇත. එසේ වුවත් ගැහැණු ළමුන් සම්බන්ධ ව එය එසේ නොවේ.

12. දෙමව්පිය අධ්‍යාපනයත් ශිෂ්‍ය රැකියා අපේක්ෂණත් අතර අන්‍යොන්‍ය යැපීමක් ඇත. එසේ වුවත් ගැහැණු ළමුන් සම්බන්ධ ව එය එසේ නොවේ.

13. දෙමව්පිය දැනීම සහ ශිෂ්‍ය රැකියා අපේක්ෂණ අතර වෙසෙසි සබඳතාවක් පවතිතත් ගැහැණු ළමුන් සම්බන්ධයෙන් එම නිගමනය වෙනස් වේ.

14. දෙමව්පිය අභිලාෂයන් ශිෂ්‍ය රැකියා අපේක්ෂණ අන්‍යොන්‍ය යැපීමකින් යුක්තයි.

15. ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය සහ ශිෂ්‍ය රැකියා අපේක්ෂණ අතර සමීප

සම්බන්ධතාවක් ඇත. එසේ වුවත් ගැහැණු ළමුන් උදෙසා එම තීරණය එසේ නොවේ.

16. ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය සහ විෂය බාහිර ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාවක් නැත.

17. ශිෂ්‍ය රැකියා අපේක්ෂණ සහ ශිෂ්‍ය විෂය බාහිර ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාවක් නොමැත.

18. දෙමව්පිය සමාජ පන්තිය, දෙමව්පිය අධ්‍යාපනය, අධ්‍යාපනික ක්‍රියාවලිය පිළිබඳ දෙමව්පිය දැනීම සහ සිය දරුවන් කෙරේ දෙමව්පියන්ගේ අභිලාෂ අතර වෙසෙසි වූ අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවතී.

* * * * *